# සැපයුම්කරුගේ චර්යාධර්ම සංග්‍රහය

ව්‍යාපාරික සදාචාරයේ ඉහළම ප්‍රමිතීන් අනුව ව්‍යාපාර පවත්වා ගෙන යාමට සහ මානව හිමිකම් හා පරිසරය කෙරෙහි ගරුසරු දැක්වීමට ෆෝට් ඔප් ද ලූම් හා අපගේ අනුබද්ධ සමාගමවල ("FOTL") අපි කැප වී සිටින්නෙමු. (සාමූහිකව "සැපයුම්කරුවන්" ලෙස හඳුන්වනු ලබන) කොන්ත්‍රාත්කරුවන්, බලපත්‍රලාභීන් සහ වෙනත් නම් කරන ලද ව්‍යාපාරික හවුල්කරුවන් ඇතුළුව, එනමුත් ඊට සීමා නොවී, අපගේ නිෂ්පාදන සපයන සියලුම කර්මාන්තායතනවලින් අපට ඒ හා සමාන කැපවීමක් අවශ්‍යයි. මෙම සැපයුම්කරුගේ චර්යාධර්ම සංග්‍රහයෙන් සැපයුම්කරුවන්ගේ කැපවීම සපුරාලන බවට අප සහතික කරන ප්‍රමිති පිළිබිඹු වන අතර ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මූලික සම්මුති සහ සාධාරණ කම්කරු සංගමයේ සේවා ස්ථාන චර්යාධර්ම සංග්‍රහය මගින් මඟ පෙන්වනු ලැබේ.

***<u>ජනතා-කේන්ද්‍රීය</u>***

<u>රැකියා සම්බන්ධත</u>: සේවකයන්ට ගරුසරු දක්වන රැකියා නීති හා කොන්දේසි සැපයුම්කරුවන් විසින් පිළිගෙන අනුගමනය කරනු ලබන අතර, අවම වශයෙන්, දේශීය හා අන්තර්ජාතික කම්කරු හා සමාජ ආරක්ෂණ නීති හා රෙගුලාසි යටතේ ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරනු ලබයි.

<u>සෞඛ්‍ය හා ආරක්ෂාව</u>: සැපයුම්කරුවන්ගේ මෙහෙයුම් නිසා ඇතිවිය හැකි අනතුරු හා තුවාල වැළැක්වීම පිණිස සැකසූ, ආරක්ෂිත හා සෞඛ්‍යමය සේවා ස්ථානයක් සැපයුම්කරුවන් විසින් ලබා දෙනු ඇත. සැපයුම්කරුවන්ට අයත් හෝ ඔවුන් විසින් පවත්වා ගෙන යන ශයනාගාර ඇතුළත්ව, සැපයුම්කරුවන්ගේ නිෂ්පාදනාගාරයක සෑම තැනම ඇති තත්වය ආරක්ෂිත හා පිරිසුදු වියයුතු අතර, ආරක්ෂාව හා සෞඛ්‍යයට අදාල නීති හා රෙගුලාසිවල අවශ්‍යතාවයන්ට අනුව හෝ ඒවා ඉක්මවා තිබිය යුතුය. සේවකයන්ට පුහුණුව ලබා දී ඔවුන්ගේ කාර්යයන් අනතුරු විරහිතව ඉටු කිරීමට ඔවුන් සූදානම් කළ යුතුය.

<u>ළමා ශ්‍රමය</u>: දේශීය අනිවාර්ය පාසල් වයස හෝ අදාල නීත්‍යානුකූල රැකියා වයස උල්ලංඝනය වන පරිදි සැපයුම්කරුවන් විසින් පුද්ගලයින් රැකියාවන්ට බඳවා නොගනු ඇත. දැන්වීම්කරණය හෝ මාධ්‍යය සඳහා ළමා නළුවන් හෝ නිරූපණ ශිල්පීන් භාවිතය හැරුණු විට, සැපයුම්කරුවන් වයස 15ට අඩු සේවකයන් බඳවා ගෙන නොමැති විට පමණක් ළමා ශ්‍රමය හා අදාල රෙගුලාසිවලට අනුකූල යයි සැලකේ.

<u>බලයෙන් ගත් ශ්‍රමය</u>: බන්ධනාගාර ශ්‍රමය, ගිවිසුම්ගත හෝ වහල් ශ්‍රමය, හෝ ඇපයට ගත් ශ්‍රමය ඇතුළත් එහෙත් ඊට සීමා නොවූ, බලහත්කාරයෙන් ගත් ශ්‍රමය සැපයුම්කරුවන් විසින් භාවිතා කරනු නොලැබේ. නිෂ්පාදනාගාර තුළ මිනිස් ජාවාරම උපයෝගී නොවන බවට සහතික වීම සඳහා අවශ්‍ය පියවර සැපයුම්කරුවන් විසින් ගෙන ඇති අතර එබඳු ක්‍රියාකාරකම් සඳහා ඔවුන්ගේ සැපයුම් දාමයන් අධීක්ෂණය කෙරේ.

<u>හිරිහැර කිරීම හෝ අපයෝජනය</u>: සැපයුම්කරුවන් සියලුම සේවකයින්ට ගෞරවයෙන් හා අභිමානයෙන් සැලකිය යුතුය. කිසිදු සේවකයෙකු කායික, ලිංගික, මානසික හෝ වාචික හිරිහැරයකට හෝ පරිභවයකට ලක් නොවන බවට සහතික වීමට අවශ්‍ය පටිපාටීන් සැපයුම්කරුවන් විසින් ක්‍රියාත්මක කර තිබිය යුතුය.

<u>නොවෙනස්ව සැලකීම</u>: ස්ත්‍රී පුරුෂ භාවය, කුලය, ආගම, වයස, ආබාධිත බව, ලිංගික දිශානතිය, ජාතිය, සමූහ සබඳතා, දේශපාලනික මතිමතාන්තර, සමාජ කණ්ඩායම් හෝ ජනවාර්ගික සම්භවය පදනම් කර ගනිමින්, බඳවා ගැනීම, වන්දි ගෙවීම, උසස් කිරීම, විනය, සේවා අවසන් කිරීම හෝ විශ්‍රාම යාම යනාදිය ඇතුළත් වූ රැකියාව සම්බන්ධ කිසිදු වෙනස්ව සැලකීමක් සැපයුම්කරුවන් විසින් සිදු නොකෙරේ.

<u>වැඩ කරන පැය</u>: සේවකයන් අදාල නීතියෙන් අනුමත වූ සාමාන්‍ය හා අතිකාල පැය ගණනට වැඩියෙන් වැඩ කිරීම සැපයුම්කරුවන් විසින් අපේක්ෂා නොකෙරේ. සාමාන්‍ය වැඩ සතිය පැය 48 නොඉක්මවන විට, සෑම දින හතක කාලයක් සඳහා අඩු තරමින් අඛණ්ඩ පැය 24ක විවේකයක් සේවකයන්ට ලබාදිය යුතු වේ. සෑම අතිකාල වැඩ කිරීමක්ම අන්‍යෝන්‍ය එකඟතාවය මත සිදු වේ. සැපයුම්කරුවන් සාමාන්‍ය පදනමින් අතිකාල කිරීම සඳහා ඉල්ලීම් නොකරන අතර අතිකාල වැඩ සඳහා අධිමිල ගණන් අනුව ගෙවීම් කරනු ඇත. විශේෂිත තත්වයන්හි දී හැර, සතියක සාමාන්‍ය හා අතිකාල මුළු පැය එකතුව පැය 60 නොඉක්මවිය යුතුය.

<u>වන්දි</u>: සේවකයාගේ මූලික අවශ්‍යතාවන් සපුරාලීමට හා යම් අභිමත ආදායමක් ලබා දීමට ප්‍රමාණවත් සාමාන්‍ය වැඩ සතියක් සඳහා වන්දි ලබා ගැනීමට සෑම සේවකයෙකුටම අයිතියක් ඇත. සැපයුම්කරුවන් විසින් යටත් පිරිසෙයින් අවම වේතනය හෝ සුදුසු පිළිගත් වේතනය යන දෙකින් වැඩි වේතනය ගෙවන අතර, වේතන පිළිබඳ සියලුම නීතිමය අවශ්‍යතා අනුගමනය කරමින්, නීතියෙන් හෝ ගිවිසුමෙන් ඉල්ලා ඇති යම් අතිරේක ප්‍රතිලාභ ද ලබා දෙනු ඇත. වන්දිවලින් සේවකයාගේ මූලික අවශ්‍යතා හා කිසියම් අභිමත ආදායමක් නොලැබෙන අවස්ථාවල දී, සැපයුම්කරුවන් විසින් වුවමනා වන්දි මට්ටම වඩාත් අවබෝධ කර ගැනීමට සුදුසු ක්‍රියා මාර්ග ගනු ඇත.

<u>එක්රැස් වීමේ නිදහස සහ සාමූහික කේවල් කිරීම</u>: නිදහසේ එක්රැස් වීම සහ සාමූහික කේවල් කිරීම සඳහා සේවකයන්ට ඇති අයිතිවාසිකම් සැපයුම්කරුවන් විසින් පිළිගෙන ඒවාට ගරු කළ යුතුය.

***<u>ග්‍රහලෝකය-දැනුවත්</u>***

සැපයුම්කරුවන්ගේ මෙහෙයුම් නිසා පරිසරයට වන සෘණාත්මක බලපෑම අවම කිරීම සඳහා ඔවුන් විසින් වගකිව යුතු ක්‍රියා මාර්ග ගනු ඇත. හානිකර ද්‍රව්‍ය නිසියාකාරව ගබඩා කිරීම හා බැහැර කිරීම, බල ශක්ති පරිභෝජනය හා අපද්‍රව්‍ය අවම වන පරිදි ව්‍යාපාර පවත්වා ගෙන යාමට කැප වීම, ස්වභාවික සම්පත් භාවිතය ප්‍රශස්ත කිරීම, හා ප්‍රතිචක්‍රීකරණය උපරිම කිරීම ඇතුළු පරිසරය සුරකින සියලුම දේශීය මෙන්ම අදාල අන්තර්ජාතික නීති සමග සැපයුම්කරුවන් අවම වශයෙන් එකඟ විය යුතුය.

***<u>නිෂ්පාදන අඛණ්ඩතාවය</u>***

<u>නීත්‍යානුකූලතාවය</u>: මෙම චර්යා සංග්‍රහයේ අවශ්‍යතාවයන් පිළිපැදීමට අමතරව, සැපයුම්කරුවන් ඔවුන්ගේ මෙහෙයුම් හා අදාල වන වෙනත් සියලුම නීති, රෙගුලාසි, හා ගිවිසුම් සමග එකඟ වනු ඇත.

<u>ව්‍යාපාරික ආචාර ධර්ම</u>: ඕනෑම ආකාරයකින්, සැපයුම්කරුවන් විසින් නිෂ්පාදන හෝ ද්‍රව්‍ය මූලාශ්‍ර අදාලව දූෂණය කිරීම, කප්පම් ගැනීම, වංචා කිරීම හෝ වැරදි ලෙස නිරූපණය කරනු ලැබීම දැඩි ලෙස තහනම් කර ඇත.අනවශ්‍ය හෝ නුසුදුසු වාසියක් සඳහා අල්ලස් පිරිනැමීම හෝ භාර ගැනීම සහ ඉල්ලා සිටි විට අමුද්‍රව්‍යවල මූලාශ්‍ර හෙළි කිරීමට අපොහොසත් වීම මෙම තහනමට ඇතුළත් නමුත් ඒවාට සීමා නොවේ. මෙම තහනම

උල්ලංඝනය කිරීම FOTL විසින් සැපයුම්කරුගේ සේවය වහාම අවසන් කරනු ලැබීමට හේතු විය හැකි අතර සැපයුම්කරු නීතිමය ක්‍රියා මාර්ගවලට යටත් වේ.

<u>උප කොන්ත්‍රාත්කරුවන</u>: FOTL වෙතින් පූර්ව ලිඛිත අනුමැතිය හා උප කොන්ත්‍රාත්කරු මෙම චර්යා සංග්‍රහයට අනුව කටයුතු කරන බවට ලිඛිත එකඟතාවය නොමැතිව, FOTL භාණ්ඩ හෝ උපාංග නිෂ්පාදනය කිරීම පිණිස සැපයුම්කරුවන් විසින් උප කොන්ත්‍රාත්කරුවන් භාවිතා නොකරනු ඇත.

<u>රේගු අනුකූලතාවය</u>: සැපයුම්කරුවන් අදාල සියලුම රේගු නීති හා එකඟ වන අතර, නීති විරෝධී නැව් භාණ්ඩ හුවමාරුවට එරෙහිව ඉන් ආරක්ෂා වීමේ වැඩසටහන් සකස්කර පවත්වා ගෙන යනු ඇත.

<u>ආරක්ෂණය</u>: FOTL නිෂ්පාදන නැව් බඩු තොගවලට අප්‍රකාශිත නැව් බඩු (උදා., මත්ද්‍රව්‍ය හා වෙනත් තහනම් ද්‍රව්‍ය) ඇතුල් වීම වැළැක්වීම පිණිස සැපයුම්කරුවන් විසින්, ත්‍රස්තවාදයට එරෙහි රේගු-වෙළඳ හවුල්කාරිත්වයේ (C-TPAT) එක්සත් ජනපදය සඳහා නැව් බඩු තොග අවශ්‍යතාවයන් හා අනුකූල ආරක්ෂණ පරිපාටීන් පවත්වා ගෙන යනු ඇත.

## <u>*ක්‍රියාත්මක හා බලාත්මක කිරීම*</u>

<u>පළ කිරීමේ අවශ්‍යතා</u>: විදේශීය සංක්‍රමණික සේවකයන් ඇතුළුව, සෑම සේවකයෙකුටම තේරෙන භාෂාවලින් සියලුම සේවකයන්ට සහ අමුත්තන්ට ප්‍රවේශ විය හැකි, පැහැදිලිව පෙනෙන ස්ථානයක සැපයුම්කරුවන් විසින් මෙම චර්යාධර්ම සංග්‍රහය පළ කරනු ඇත. මෙම චර්යා සංග්‍රහයේ අන්තර්ගතයන් සම්බන්ධයෙන් සැපයුම්කරුවන් විසින් වාර්ෂිකව සියලුම සේවකයන් සමග සංනිවේදනය හා පුහුණු කිරීම් සිදු කරනු ඇත.

<u>වාර්තා තැබීම</u>: අනුකූලතාවය සමීක්ෂණය කිරීම පිණිස සැපයුම්කරුවන් විසින් මෙම චර්යා සංග්‍රහයේ සෑම කාරණාවක් සම්බන්ධයෙන්ම සම්පූර්ණ හා නිවැරදි වාර්තා පවත්වා ගනු ඇත.

<u>සැපයුම්කරුගේ මාර්ගෝපදේශ; බලපත්‍රලාභී සමාජ අනුකූලතා අත්පොත</u>: අදාල වන පරිදි, FOTL ආයතනික වෙබ් අඩවිය වන www.fotlinc.com වෙතින් සොයා ගත හැකි සැපයුම්කරුගේ මාර්ගෝපදේශවල සහ/හෝ බලපත්‍රලාභී සමාජ අනුකූලතා අත්පොතේ සවිස්තරාත්මකව දැක්වෙන අවශ්‍යතා සැපයුම්කරුවන් විසින් සපුරා ලනු ඇත.

<u>අගැයීම් සහ නිවැරදි කිරීමේ කටයුතු</u>: මෙම චර්යා සංග්‍රහයට අනුකූල වීම සහතික කිරීම සඳහා ස්ථානීය හා/හෝ නියමාකාර අගැයීම් සිදු කිරීම පිණිස FOTL විසින් අභ්‍යන්තර මෙන්ම ස්වාධීන විගණකවරුන් යොදා ගනු ඇත. එබඳු සියලුම ඇගයීම් සමග සැපයුම්කරුවන් සම්පූර්ණ සහයෝගය දක්වන අතර සමලෝචනය සඳහා විස්තරාත්මක අනුකූලතා වාර්තා ලබා දෙනු ඇත. අනනුකූල ක්ෂේත්‍රයන් නිවැරදි කිරීමේ කාර්ය සැලසුම් හේතු සහගත ආකාරයෙන් වර්ධනය කිරීම පිණිස සැපයුම්කරුවන් FOTL සමග කටයුතු කරනු ඇත.

<u>උල්ලංඝනය කිරීම් වාර්තා කිරීම</u>: මෙම චර්යාධර්ම සංග්‍රහයේ සැක සහිත උල්ලංඝනය කිරීම් වාර්තා කිරීම සඳහා, +1-270-935-2588 දුරකථනයෙන්, code@fotlinc.com ඊමේලයෙන්, හෝ ජංගම උපාංගයක් භාවිතයෙන් දකුණු පැත්තේ ඇති කේතය ස්කෑන් කිරීමෙන්, FOTL ආයතනික සමාජ වගකීම් දෙපාර්තමේන්තුව සමග සම්බන්ධ වන්න. කරුණාකර සම්බන්ධ වූ පාර්ශ්ව සහ චෝදනා කරන ලද උල්ලංඝණය කිරීම් පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු, ගැටළුව සෘජුව විසඳීමට ගෙන ඇති පියවර, සහ අපට ගැටළුව පිළිබඳව රහසිගතව සන්නිවේදනය කිරීම සඳහා සබඳතා තොරතුරු සපයන්න. මෙම චර්යා සංග්‍රහය උල්ලංඝනය කිරීම් පිළිබඳ වාර්තා කළ හෝ සිදුවිය හැකි උල්ලංඝනයන් පිළිබඳ විමර්ශනයන්ට උදව් කළ හෝ සහභාගි වූ පුද්ගලයන්ට එරෙහිව එකටෙක කිරීම ඉඳුරාම තහනම්ය. යම් පලිගැනීමක් වෙතොත් ඒ පිළිබඳව FOTL වෙත ඉහත දැක්වූ පරිදි වාර්තා කළ යුතුය.

සංස්කරණය - 2022 පෙබරවාරි

FRUIT OF THE LOOM · Bestform · B.V.D. · SPALDING TRUE TO THE GAME. · RUSSELL ATHLETIC · VANITY FAIR · JERZEES